OL/2025(2026)/82/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**82 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | | |
|---|---|---|
| ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය | I, II | පැය තුනයි |
| நீருயிரினவளத் தொழினுட்பவியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Aquatic Bioresources Technology | I, II | Three hours |

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** මිරිදිය හා කරදිය ජලය මිශ්‍ර වූ පරිසර පද්ධතිය,
(1) වගුරු වේ. (2) බොක්ක වේ. (3) මෝය වේ. (4) විල්ලුව වේ.

**2.** කිවුල්දිය ජලයේ මෙක්කයන් වගා කිරීම සඳහා සුදුසු ප්‍රශස්ත ලවණ පරාසය වනුයේ,
(1) 0 - 5 ppt ය. (2) 10 - 30 ppt ය. (3) 40 - 45 ppt ය. (4) 60 - 70 ppt ය.

**3.** සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ බෙල්ලන් වගාව සඳහා බහුල ව භාවිත කරනු ලබන්නේ,
(1) කොටු වේ. (2) මඩ පොකුණු වේ. (3) පහුරු වේ. (4) වීදුරු ටැංකි වේ.

**4.** ඉස්සන් වගාවේ දී වර්ධක පොකුණුවල තැන්පත් කරන ඉස්සන්ගේ ජීවන චක්‍රයේ අවධිය වනුයේ,
(1) නෝප්ලියා ය. (2) ප්‍රොටොසොයියා ය.
(3) මයිසිස් ය. (4) පසු කීටයා ය.

**5.** නවීන ධීවර යාත්‍රාවලට ක්ෂිතිජයෙන් ඔබ්බට දිගු දුරක් සන්නිවේදනය කිරීමට ඉඩ සලසන උපකරණය වනුයේ,
(1) චන්ද්‍රිකා දුරකථනය ය. (2) සෝනා මානය ය.
(3) ශබ්ද විකාශන යන්ත්‍රය ය. (4) VHF රේඩියෝව ය.

**6.** නවීන ඩිංගි බෝට්ටු සෑදීමට භාවිත කරන ප්‍රධාන අමුද්‍රව්‍යය වනුයේ,
(1) ලී ය. (2) ෆයිබර් ග්ලාස් ය. (3) ලෝහ තහඩු ය. (4) උණ බම්බු ය.

**7.** අලුත් මත්ස්‍යයකුගේ නිරීක්ෂණය කළ හැකි ලක්ෂණයක් වනුයේ,
(1) තෙත් වරල් වේ. (2) වියළි කොරපොතු වේ.
(3) මෘදු සම වේ. (4) දුඹුරු පැහැති කරමල වේ.

**8.** කඩොලාන ශාකවල දක්නට ලැබෙන දණහිස් මුල් හා වායුධර මුල්වල ප්‍රධාන කාර්යභාරය වනුයේ,
(1) ශාකයේ ජලය ගබඩා කිරීම ය.
(2) ලුණු සහිත ජලය අවශෝෂණය කිරීම ය.
(3) ශාකයේ ස්ථායීතාව පවත්වා ගැනීම ය.
(4) ශ්වසනය සඳහා අවශ්‍ය ඔක්සිජන් ලබා ගැනීම ය.

[දෙවැනි පිටුව බලන්න.

**9.** බේරුවල ධීවර ගම්මානයට ආසන්න ව පිහිටා ඇති, කුඩා පරිමාණ ධීවර කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් සහාය වන ජාත්‍යන්තර ප්‍රදීපාගාරය වනුයේ,
(1) බාබේරියන් ය. (2) දෙවුන්දර තුඩුව ය.
(3) කුඩා රාවණා ය. (4) මහා රාවණා ය.

**10.** ස්වාභාවික විපත්වල දී ධීවරයන්ට මූල්‍යමය වශයෙන් සෘජුවම හා ක්ෂණික ව සහාය වන සුබසාධක ආයතන වනුයේ,
(1) අඩු පොලී ණය සපයන බැංකු ය. (2) ධීවර රක්ෂණ ආයතන ය.
(3) ධීවර ප්‍රජා සංවිධාන ය. (4) යටිතල පහසුකම් සපයන රාජ්‍ය නොවන ආයතන ය.

**11.** ජලජීවී වගාවේ දී වඩාත් ම තීරණාත්මක අභියෝගය වනුයේ,
(1) ගබඩා පහසුකම් හිඟයයි. (2) පුහුණු ශ්‍රමය හිඟයයි.
(3) නවීන උපකරණ හිඟයයි. (4) ගුණාත්මක ආහාර හිඟයයි.

**12.** මාළු සකසන්නෙක් ලුණු සහ කුළුබඩු එකතු කර මාළු ටින්වල අසුරයි. මෙම ක්‍රියාවලියේ මූලික අරමුණ වන්නේ,
(1) මාළුවල පෙනුම වඩාත් ආකර්ෂණීය කිරීම ය. (2) මාළුවල ජීව කාලය දීර්ඝ කිරීම ය.
(3) මාළු අලෙවිය පහසු කිරීම ය. (4) මාළු ප්‍රවාහනය පහසු කිරීම ය.

**13.** ශ්‍රී ලංකාවේ ධීවර අංශයේ අභියෝග අතර රෝග කළමනාකරණය ඉතා වැදගත් වන්නේ එය ප්‍රධාන වශයෙන්,
(1) ආහාර සුරක්ෂිතතාවට බලපාන බැවිනි.
(2) මාළුවල රසවත්භාවයට බලපාන බැවිනි.
(3) රැකියා අවස්ථා සඳහා බලපාන බැවිනි.
(4) සංචාරක ව්‍යාපාරයට බලපාන බැවිනි.

**14.** ආහාර පරීක්ෂණ ක්‍රම තුනක් පහත දැක්වේ.
A - භෞතික පරීක්ෂණය
B - රසායනික පරීක්ෂණය
C - ජීව විද්‍යාත්මක පරීක්ෂණය
ඉහත ක්‍රම අතුරෙන් මත්ස්‍යයන් සිසිල් ව තබා ගැනීමට අයිස් භාවිත කිරීම අයත් වන්නේ,
(1) A ට පමණි. (2) C ට පමණි. (3) A හා C ට ය. (4) B හා C ට ය.

**15.** කංකුං ප්‍රචාරණය කිරීම සඳහා යොදා ගනු ලබන ශාක කොටස වනුයේ,
(1) පත්‍ර ය. (2) කඳ ය. (3) පුෂ්ප ය. (4) මූල් ය.

**16.** ආර්ටීමියා බිත්තර රක්කවීමේ දී රැකුම් අනුපාතය වැඩි කර ගැනීමට ලබා දිය යුතු තත්ත්වයක් වනුයේ,
(1) ජල ටැංකිය අඳුරේ තැබීම ය.
(2) ජලය අඛණ්ඩ ව වාතනය කිරීම ය.
(3) ජලයේ ඉහළ ලවණතා මට්ටමක් පවත්වා ගැනීම ය.
(4) ජලය සම්පූර්ණයෙන් ම නිශ්චල ව පවත්වා ගැනීම ය.

**17.** මත්ස්‍ය පොකුණක 10% ක හයිඩ්‍රිල්ලා ආවරණයක් පැවතුණි. සති හතරකට පසු එම ආවරණය 60% දක්වා වැඩි වුණි. මෙම වැඩි වීමෙන් පසු මත්ස්‍යයන්ට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභය විය හැක්කේ,
(1) ජලයේ ඔක්සිජන් වැඩි වීමයි. (2) ජල ප්‍රවාහය මන්දගාමී වීමයි.
(3) හිරු එළිය අඩු වීමයි. (4) වඩා හොඳ සැඟවීමේ අවකාශ ලැබීමයි.

**18.** මිරිදිය විසිතුරු මත්ස්‍යයකුගේ ශරීරයේ සහ වරල්වල සුදු පුළුන් ආකාර ලප වර්ධනය වීමක් සහ මත්ස්‍යයාගේ හැසිරීමේ උදාසීන බවක් පෙන්නුම් කරයි. මෙයට හේතුව විය හැක්කේ,
(1) බැක්ටීරියා ආසාදනයකි. (2) වෛරස් ආසාදනයකි.
(3) පරපෝෂිත ආසාදනයකි. (4) දිලීර ආසාදනයකි.

**19.** මධ්‍යම කඳුකරයේ අධික වර්ෂාපතනයෙන් පසු කැලණි ගඟ මඩ සහිත වන බව ශිෂ්‍යයකු නිරීක්ෂණය කළේ ය. මෙයට ප්‍රධාන හේතුව විය හැක්කේ,
(1) ගඟේ ඉවුරුවලින් ගසාගෙන එන අවසාදිත වීමයි.
(2) ගඟේ කාර්මික රසායනික ද්‍රව්‍ය බැහැර වීමයි.
(3) ගඟේ ජලපෝෂක ප්‍රදේශයේ පාංශු ඛාදනය වීමයි.
(4) ගං පත්ලේ උල්පත්වලින් මඩ මිශ්‍ර වීමයි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

0794

**20.** මත්ස්‍ය වගාකරුවකු තම පොකුණේ සෙකි තැටියේ පාඨාංකය 60 cm බව සටහන් කරන ලදී. මෙයින් පෙන්නුම් කරන්නේ ජලය,

(1) මධ්‍යස්ථ පැහැදිලි බවක් සහිත බවයි. (2) ඉහළ ආවිලතාවක් සහිත බවයි.
(3) ඉහළ පැහැදිලිතාවක් සහිත බවයි. (4) අසාමාන්‍ය දූෂණයක් සහිත බවයි.

● පහත දී ඇති රූපය ඇසුරෙන් ප්‍රශ්න අංක **21** හා **22** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**21.** රූපයේ දැක්වෙන කොරල්පර පද්ධතිය කාලයත් සමග ස්ථාවර ව පවතින බව හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.

(1) කොරල්පර සහ සහජීවී ඇල්ගීවල පෝෂ්‍ය ද්‍රව්‍ය හුවමාරුව ඉහළ ශක්ති ප්‍රවාහයකට උදවු වේ.
(2) කොරල් අනෙකුත් ජීවීන් මත නොයැපී සියලු ම පෝෂක ද්‍රව්‍ය සෘජු ව ලබා ගනියි.
(3) කොරල් තුළ ඇල්ගී වර්ධනය වීම මත්ස්‍යයන්ගෙන් පාලනය වේ.
(4) කොරල් ගහනය විලෝපික-ගොදුරු සම්බන්ධතාව මගින් පමණක් පවත්වා ගනියි.

**22.** වෙරළාසන්න ජලයේ පෝෂක ඉහළ නැංවීමට මිනිස් ක්‍රියාකාරකම් හේතු වේ. මෙම පෝෂක වැඩි වීම නිසා ඉහත රූපයේ පෙන්වා ඇති ජලජ පරිසර පද්ධතියට විය හැකි බලපෑම කුමක් විය හැකි ද?

(1) ජලයේ වැඩි පෝෂ්‍ය පදාර්ථ නිසා කොරල් වර්ධනය වැඩි වේ.
(2) සහජීවී නොවන ඇල්ගී අධික ව වර්ධනය වීමෙන් කොරල්වල පැවැත්ම අඩු වේ.
(3) කොරල් බුහුබාවන් පෝෂණය සඳහා ඇල්ගී මත යැපීම නතර කරයි.
(4) විලෝපිකයින් පරිසර පද්ධතිය වඩාත් ඵලදායී ලෙස පාලනය කරයි.

**23.** මත්ස්‍ය ආහාර සම්බන්ධ ව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) වියළි, ශීත සහ වායුරෝධක බඳුන්වල ආහාර ගබඩා කළ යුතු ය.
(2) උදෑසන පමණක් ආහාර සැපයීමෙන් ආහාර පරිවර්තන අනුපාතය උපරිම වේ.
(3) කාබෝහයිඩ්‍රේට, පරිණත මසුන් සඳහා වඩා වැදගත් පෝෂකයක් වේ.
(4) ජලය මතුපිට ආහාර බුදින්නන්ට පාවෙන පෙලට් දීමෙන් ආහාර නාස්තිය වැඩි වේ.

**24.** ප්‍රවාහනයේ දී මාළු නරක් වීමේ වේගය වැඩි වන ආකාරයක් වනුයේ,

(1) සෙවණ සහිත ප්‍රදේශයක මාළු පෙට්ටි ගබඩා කිරීම ය.
(2) එන්ජිම අසල මාළු පෙට්ටි තබා ගැනීම ය.
(3) තෙත් ගෝනිවලින් මාළු ආවරණය කිරීම ය.
(4) සාමාන්‍ය ජලය සහිත සෘජුෆෝම් පෙට්ටි භාවිත කිරීම ය.

**25.** මාළු පරිරක්ෂණ ශිල්ප ක්‍රමය හා අදාළ පැහැදිලි කිරීම නිවැරදිව ගැළපෙන වරණය තෝරන්න.

(1) අයිස් දැමීම - ක්ෂුද්‍ර ජීවීන් සම්පූර්ණයෙන් විනාශ වීම.
(2) දුම් ගැසීම - හිතකර ක්ෂුද්‍රජීවී ගහනය වැඩි වීම.
(3) වියළීම - තෙතමනය සම්පූර්ණයෙන් ම ඉවත් වීම.
(4) ලුණු දැමීම - ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය මන්දගාමී වීම.

**26.** නෙළාගත් පසු මත්ස්‍යයන්ගේ නැවුම් බව පවත්වා ගැනීමේ නිවැරදි අනුපිළිවෙළ මින් කුමක් ද?

(1) අතුණුබහන් ඉවත් කිරීම ⟶ ප්‍රමාණය අනුව වෙන් කිරීම ⟶ සේදීම ⟶ අයිස් දැමීම
(2) අතුණුබහන් ඉවත් කිරීම ⟶ අයිස් දැමීම ⟶ ප්‍රමාණය අනුව වෙන් කිරීම ⟶ සේදීම
(3) සේදීම ⟶ අතුණුබහන් ඉවත් කිරීම ⟶ ප්‍රමාණය අනුව වෙන් කිරීම ⟶ අයිස් දැමීම
(4) ප්‍රමාණය අනුව වෙන් කිරීම ⟶ අයිස් දැමීම ⟶ අතුණුබහන් ඉවත් කිරීම ⟶ සේදීම

**27.** ඇඹුල් තියල් සැකසීමේ දී ගොරකා එකතු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) මාංසය මෘදු කිරීමට සහ පරිරක්ෂකයක් ලෙස ය.
(2) ඇඹුල් රසක් ලබාදීමට සහ පරිරක්ෂකයක් ලෙස ය.
(3) ඇඹුල් රසක් ලබාදීමට සහ මාංසය මෘදු කිරීමට ය.
(4) වර්ණය වැඩිදියුණු කිරීමට සහ මාංසය මෘදු කිරීමට ය.

● පහත රූපසටහන ඇසුරෙන් **28** වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




**28.** ඉහත රූපසටහනේ පෙන්වා ඇති මුහුදු ගමනේ දී ඉස්මතු කර දක්වන ක්‍රියාකාරකම වන්නේ,
(1) තාවකාලික ව නැංගුරම දැමීම වේ.
(2) යාත්‍රාවරණය සහ සැලසුම් කිරීම වේ.
(3) මත්ස්‍යයන් සිටින ස්ථාන හඳුනා ගැනීම වේ.
(4) අනෙකුත් යාත්‍රා සමග සන්නිවේදනය සිදු කිරීම වේ.

**29.** මිනිසෙක් කොරල්පරයක් අසල මසුන් ඇල්ලීමට පුපුරණ ද්‍රව්‍ය භාවිත කරන ලදී. ඔහු උල්ලංඝනය කළේ,
(1) සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතයි.
(2) වෙරළ තීරය කළමනාකරණ රෙගුලාසියි.
(3) ධීවර සහ ජලජ සම්පත් පනතයි.
(4) වනජීවී හා වන සංරක්ෂණ ආඥා පනතයි.

**30.** අනෙකුත් පාරම්පරික ධීවර යාත්‍රාවලින් කොල්ලා ඔරුව වෙන්කර හඳුනා ගැනීමේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) මාළු දැල් හෝ අධික බර රැගෙන යෑම සීමිත වීමයි.
(2) පහසු පරිහරණය සඳහා තනි ඔරු කඳකින් සකසා තිබීමයි.
(3) යාත්‍රා කිරීම ප්‍රධාන වශයෙන් අතින් හබල් ගෑම මත රඳා පැවතීමයි.
(4) වැඩි ස්ථායිතාවක් සඳහා සමාන්තර ඔරු කඳන් දෙකකින් සාදා තිබීමයි.

**31.** පහත ප්‍රකාශ කකුළුවන් තර කිරීම මත පදනම් වේ.
A - තර කිරීම සඳහා වතුර කකුළුවන් සුදුසු වේ.
B - කකුළුවන් තර කිරීම සඳහා හොඳ ම ක්‍රමය වන්නේ ගැඹුරු මුහුදේ කූඩු භාවිතයයි.
C - කකුළුවන් තර කිරීමේ දී ආහාර ලෙස මුහුදු පැළෑටි බහුල ව භාවිත කෙරේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි. (4) B හා C පමණි.

**32.** ශ්‍රී ලංකා-ඉන්දීය සමුද්‍ර මායිම් ගිවිසුම ප්‍රධාන වශයෙන් ම උපකාරී වන්නේ,
(1) ධීවර බෝට්ටු සඳහා ආරක්ෂිත ස්ථාන සැපයීමට ය.
(2) ගැඹුරු මුහුදේ පාරිසරික දත්ත රැස්කිරීම හා බෙදා ගැනීමට ය.
(3) වෙරළබඩ සංචාරක ව්‍යාපාරය සඳහා නව ප්‍රදේශ සංවර්ධනය කිරීමට ය.
(4) නීති විරෝධී ලෙස මසුන් ඇල්ලීම වැළැක්වීම සහ සාධාරණ ව සම්පත් බෙදා ගැනීමට ය.

**33.** විසිතුරු මත්ස්‍ය ටැංකියක ජලයේ ඇමෝනියා එක්රැස් වීම නිසා ඇති වන බලපෑම කුමක් ද?
(1) විෂ බව සහ ආතතිය වැඩි වීම
(2) ප්‍රජනනය වැඩිවීම සහ ආතතිය අඩු වීම
(3) වර්ණවත්භාවය සහ වර්ධන වේගය වැඩි වීම
(4) ආහාර ගැනීමේ වේගය සහ වර්ධන වේගය වැඩි වීම

**34.** අස්ථික මත්ස්‍යයන් කාටිලේජීය මත්ස්‍යයන්ගෙන් වෙන් කර හඳුනා ගැනීමට ඉවහල් වන ලක්ෂණය මින් කුමක් ද?
(1) ආරක්ෂිත කොරපොතුවලින් ආවරණය වූ ශරීරය
(2) උත්ප්ලාවකතාව පාලනය කිරීමට වාතයෙන් පිරුණු වාතාශය
(3) ජලයෙන් ඔක්සිජන් නිස්සාරණය කිරීමට භාවිත කරන කරමල්
(4) ජලය තුළ චලනය වීමට හා ස්ථායිතාව පවත්වා ගැනීමට හේතු වන යුගල වරල්

**35.** මත්ස්‍යයින්ගේ වේෂාන්තරණයට අදාළ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A - මත්ස්‍යයන්ට ඔවුන්ගේ විලෝපිකයින්ගෙන් ආරක්ෂා වීමට වේෂාන්තරණය උපකාරී වේ.
B - වේෂාන්තරණය වූ මත්ස්‍යයන් පහසුවෙන් හඳුනා ගත හැක්කේ ඔවුන් සෑම විට ම දීප්තිමත් වර්ණයක් ගන්නා බැවිනි.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A පමණක් සත්‍ය වේ.
(2) B පමණක් සත්‍ය වේ.
(3) A හා B යන ප්‍රකාශ දෙක ම සත්‍ය වේ.
(4) A හා B යන ප්‍රකාශ දෙක ම අසත්‍ය වේ.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



● ධීවර ආම්පන්නවල රූප තුනක් A, B හා C ලෙස පහත දක්වා ඇත. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක **36** ට පිළිතුරු සපයන්න.



A B C

**36.** ඉහත රූපවලින් හානිකර නොවන ධීවර ආම්පන්නය/ආම්පන්න වන්නේ
(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි.

**37.** මත්ස්‍යයන්ගේ ශ්වසන පද්ධතිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්වසනය කරමල් සූත්‍රිකා මත පමණක් රඳා පවතින බැවින් ටූනා මසුන්ට අඩු ඔක්සිජන් සහිත ජලයේ ජීවත් විය නොහැකි ය.
(2) ශ්වසනය කරමල් සූත්‍රිකා මත පමණක් රඳා පවතින බැවින් අගුළුවාට අඩු ඔක්සිජන් සහිත ජලයේ ජීවත් විය නොහැකි ය.
(3) ශ්වසනය කරමල් සූත්‍රිකා මත පමණක් රඳා පවතින බැවින් ආඳාට අඩු ඔක්සිජන් සහිත ජලයේ ජීවත් විය නොහැකි ය.
(4) ශ්වසනය සඳහා විශේෂ ශ්වසන අවයව ඇති බැවින් තිලාපියාට අඩු ඔක්සිජන් සහිත ජලයේ වුව ද ජීවත් විය හැකි ය.

**38.** ආහාරමය මත්ස්‍ය වගාව පිළිබඳ පහත දී ඇති ප්‍රකාශ සලකා බලන්න.
A - තිලාපියා ශ්‍රී ලංකාවේ වඩාත් ව්‍යාප්ත ව වගා කරන මිරිදිය මත්ස්‍යයෙකි.
B - වික්ටෝරියා වැනි විශාල ජලාශවල කූඩු තුළ මත්ස්‍ය වගාව සුලබ ව සිදු කරනු ලැබේ.
C - ඉහළ ආහාර පරිවර්තන අනුපාතය මගින් ආහාර භාවිතය වඩා කාර්යක්ෂම බව දක්වයි.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශ වනුයේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C යන සියල්ල ම ය.

● **39** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සටහන ආධාර කර ගන්න.

**39.**




ඉහත සටහනේ P ලෙස දක්වා ඇති තිරසර කළමනාකරණ ක්‍රමය වනුයේ,
(1) බලාත්මක කළමනාකරණයයි. (2) විශේෂිත ප්‍රදේශ කළමනාකරණයයි.
(3) පරිසරය ආශ්‍රිත කළමනාකරණයයි. (4) ප්‍රජා මූලික හවුල් කළමනාකරණයයි.

**40.** 100 $l$ ක ධාරිතාවෙන් යුත් ටැංකියක් තුළ 2 cm දිගැති මත්ස්‍යයන් (එක සතකුට 2 $l$) සහ 4 cm දිගැති මත්ස්‍යයන් (එක් සතකුට 4 $l$) වගා කිරීමට බලාපොරොත්තු වේ. මෙම ටැංකියට කුඩා මත්ස්‍යයන් 20 ක් දමා තිබේ නම් ටැංකියට දැමිය හැකි විශාල මත්ස්‍ය සංඛ්‍යාව වනුයේ,
(1) 10 කි. (2) 15 කි. (3) 20 කි. (4) 25 කි.

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

82 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය I, II
நீருயிரினவளத் தொழினுட்பவியல் I, II
Aquatic Bioresources Technology I, II

## ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. (A) දිට්වා සුළි කුණාටුවෙන් පසු අධික වර්ෂාව හා ගංවතුර හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ අභ්‍යන්තර ජල දේහ පිටාර ගැලීම සිදු වූ අතර එය ජලජීවී වගාවට මෙන් ම සාගර ධීවර කර්මාන්තයට ද දැඩි ලෙස බලපෑවේ ය.

(i) දිට්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ අභ්‍යන්තර ජල දේහ වර්ග **දෙකක්** නම් කරන්න.

(ii) ගංවතුර හේතුවෙන් අභ්‍යන්තර ජල දේහවලට බලපෑම් ඇති වූ ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(iii) සුළි සුළං නිසා සාගර ධීවර කටයුතුවලට සිදු වූ පාරිසරික බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(iv) සුළි සුළං හේතුවෙන් ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය අඩාල වූ ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(v) අනාගත ආපදාවල දී ධීවර හා ජලජීවී වගා අංශයේ පාඩු අවම කර ගැනීම සඳහා ගත හැකි උපාය මාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(vi) ජල ගැල්මෙන් පසු ජලජීවී වගා නිෂ්පාදනය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගත හැකි උපාය මාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(B) දුම් ගැසූ තිලාපියා මාළු සකස් කිරීමට සිසුවකුට අවශ්‍ය විය. ඔහු මාළුන්ගේ අතුණුබහන් සහ අනවශ්‍ය කොටස් ඉවත් කර හොඳින් සේදුවේ ය. ඉන් පසු ලුණු සහ අනෙකුත් පදම් කිරීමේ ද්‍රව්‍ය එකතු කරන ලදී. පසු ව එම මාළු, පතුලේ දැලක් සහිත රාක්කයක බහා කුරුඳු දර භාවිතයෙන් දුම් ගස්වන ලදී.

(i) ඉහත ක්‍රියාවලියේ දී යොදාගත් පහත සඳහන් පියවරවලට හේතුවක් බැගින් සඳහන් කරන්න.

(a) අතුණුබහන් ඉවත් කිරීම

(b) සේදීම

(c) පදම් කිරීම

(d) දැල් සහිත රාක්කයක මත්ස්‍යයන් තැබීම

(ii) දුම් ගැසීම සඳහා කුරුඳු දර භාවිත කිරීමේ වාසියක් සහ අවාසියක් බැගින් සඳහන් කරන්න.

(iii) දුම් ගැසීමෙන් පසු මත්ස්‍යයන්ගේ දෘශ්‍යමාන වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(iv) දුම් ගැසූ මාළු පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු සනීපාරක්ෂක පූර්වෝපායන් **දෙකක්** සඳහන් කරන්න.

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

**2.** මත්ස්‍යයන් අල්ලා ගැනීමේ සිට බෙදාහැරීමට සූදානම් වන තෙක් හැසිරවීම හා සම්බන්ධ මූලික පියවර පහත දැක්වෙන ගැලීම් සටහනින් පෙන්වා ඇත.




(i) (a) සැකසීම සඳහා අලුත් මාළු ලබා ගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

(b) මාළුවල ගුණාත්මකභාවය හා සෞඛ්‍යාරක්ෂිත බව පවත්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න.

(ii) මාළු පරිරක්ෂණ ක්‍රම **හතරක්** නම් කර, එම ක්‍රම මත්ස්‍යයන්ගේ නැවුම් බව දිගු කිරීමට උපකාරී වන ආකාරය විස්තර කරන්න.

(iii) ප්‍රවාහනයේ දී සහ ගබඩා කිරීමේ දී මාළුවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා ඇසුරුම්කරණයේ කාර්යභාරය විස්තර කරන්න.

**3.** පොකුණක සිටින මත්ස්‍යයන්ගේ විවිධ වර්ධන අවධිවල ප්‍රෝටීන අවශ්‍යතා පහත ප්‍රස්තාරයේ දැක්වේ.




(i) (a) ඉහත ප්‍රස්තාරයට අනුව ඉහළ ම ප්‍රෝටීන ප්‍රතිශතයක් අවශ්‍ය වන්නේ කුමන වර්ධන අවධියේ දී ද?

(b) එයට හේතුව පැහැදිලි කරන්න.

(ii) (a) මත්ස්‍ය වගා පොකුණක බහුල ව භාවිත කරන ප්‍රෝටීන සරු මත්ස්‍ය ආහාර වර්ග **හතරක්** නම් කරන්න.

(b) මත්ස්‍ය වගාවේ දී නිසි පෝෂණය වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(iii) මත්ස්‍යයකුගේ සාමාන්‍ය බර 200 g ක් වන මත්ස්‍යයන් 100 ක් පොකුණක සිටී නම් සහ එක් එක් මත්ස්‍යයාට දිනකට ඔවුන්ගේ ශරීර බරින් 2% ක් ආහාර ලබාදිය යුතුනම්, දිනකට එම පොකුණට සැපයිය යුතු මුළු ආහාර ප්‍රමාණය ගණනය කරන්න.

**4.** ඉස්සන් වගාව ශ්‍රී ලංකාවේ ජලජීවී වගාවේ වැදගත් කොටසකි.

(i) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වගා කරන ඉස්සන් විශේෂයක් නම් කරන්න.

(b) කිවුල්දිය ඉස්සන් වගාව සඳහා යෝග්‍ය වන ජලයේ ගුණාත්මක පරාමිති **දෙකක්** සඳහන් කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාවට බහුල ව බලපාන රෝග **දෙකක්** නම් කර, ඉන් එක එකක් සඳහා වැළැක්වීමේ පියවර බැගින් සඳහන් කරන්න.

(iii) (a) ශ්‍රී ලංකාවේ කිවුල්දිය ඉස්සන් වගාවේ නියැලෙන වගාකරුවන් මුහුණදෙන අභියෝග **හතරක්** සඳහන් කරන්න.

(b) එම අභියෝග ජය ගැනීමට වගාකරුවන්ට ගත හැකි තිරසර පිළිවෙත් විස්තර කරන්න.

**5.** ගංගා යනු ශ්‍රී ලංකාවේ වැදගත් මිරිදිය පරිසර පද්ධතියක් වන අතර එය විවිධ ජලජ පැළෑටි සහ සතුන් සඳහා වාසස්ථාන සපයයි.

(i) ගංගා පරිසර පද්ධතියේ පාරිසරික වැදගත්කම පිළිබඳ කරුණු **දෙකක්** විස්තර කරන්න.

(ii) (a) ශ්‍රී ලංකාවේ ගංගාවල වෙසෙන ඒකදේශික මිරිදිය මත්ස්‍ය විශේෂ **දෙකක්** නම් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ ගංගාශ්‍රිත ව වැඩෙන ආහාරමය ජලජ පැළෑටි **දෙකක්** නම් කරන්න.

(iii) (a) ගංගා පරිසර පද්ධතිවල පැවැත්මට බාධා කරන මිනිස් ක්‍රියාකාරකම් **දෙකක්** සඳහන් කරන්න.

(b) ගංගා පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට සුදුසු කළමනාකරණ පිළිවෙත් **හතරක්** විස්තර කරන්න.

**6.** ජල දේහ හා ඉලක්කගත විශේෂ අනුව ධීවරයෝ විවිධ ධීවර ආම්පන්න සහ යාත්‍රා භාවිත කරති.

(i) ධීවර ආම්පන්න හා යාත්‍රාවල නිසි තේරීම තිරසර ධීවර කළමනාකරණයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) නවීන ධීවර යාත්‍රා සහ ආම්පන්න භාවිතය ධීවරයන්ගේ ඵලදායීතාවට සහ ජීවනෝපායට බලපා ඇති ආකාරය විස්තර කරන්න.

(iii) (a) ජලජ පරිසර පද්ධතිවල තිරසරබවට **අහිතකර** ලෙස බලපාන ධීවර ආම්පන්න **දෙකක්** නම් කරන්න.

(b) ඉහත (a) හි සඳහන් කළ එක් ආම්පන්නයක් තෝරා, එහි ක්‍රියාකාරීත්වය එම පරිසර පද්ධතියේ තිරසර බවට **අහිතකර** ලෙස බලපාන ආකාරය පැහැදිලි කරන්න.

**7.** ධීවර කටයුතු සිදු කරන ස්ථානයක සිදු කෙරෙන ක්‍රියාකාරකම් ඇතුළත් රූපයක් පහත දැක්වේ.



(i) ඉහත රූපයේ දැක්වෙන ස්ථානයේ සිදුවන ක්‍රියාකාරකම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඉහත රූපයේ දැක්වෙන පරිසරය මත්ස්‍යයන්ගේ නැවුම්බව සහ සෞඛ්‍යාරක්ෂිතබව කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(iii) ඉහත රූපයේ පෙන්වා ඇති ආකාරයේ ස්ථානවල සංවර්ධනයට ධීවර වරාය නීතිගත සංස්ථාව සහ ධීවර සංස්ථාව මගින් දැක්විය හැකි දායකත්වය විස්තර කරන්න.

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 200



Rs : 200



Rs : 200



Rs : 250



Rs : 250



Rs : 200



Rs : 200



Rs : 200



Rs : 300



Rs : 300



Rs : 200



Rs : 200



Rs : 250



Rs : 650

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY VISA mastercard KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE

# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE